**ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය.

මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී, මුදල් කරන ලද ඇප බැඳුම්කර වශයෙන් ඉදිකිරීම් සේවායෝජකයින් 4 දෙනෙකුට ගෙවා තිබුණු රු.16,316,700 ක්,අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීම සඳහා ණයගැති ගිණුමට හර කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ලාභයට එරෙහිව කපා හැර තිබුණි.

විෂයගත වූ ඇපකර සම්බන්ධයෙන් දැනටමත් ආයතන සමඟ සාකච්ජා කර සුදුසු විෂයයන් බේරුම්කරණයට ලක්කිරීමට මූලික කටයුතු යොදා ඇති බව සභාපතිවරයා දැනුම් දී ඇත.

(ආ) බාහිර සේවා පදනම මත ගෙවා තිබුණු වැටුප්, වේතන හා වෙනත් දීමනාවල එකතුව රු.8,429,950 ක් පුද්ගලික පඩි නඩි වශයෙන් වර්ගීකරණය කිරීම වෙනුවට පර්යේෂණ හා සංවර්ධන වියදම් වශයෙන් වර්ගීකරණය කර තිබුණි.

1.2.2. නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් .

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව. | අනුකූල නොවීම. |
|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.2.1 (අ) ඡේදය | 2000 සිට 2011 වර්ෂය දක්වා වූ වාර්ෂික ගිණුම් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| 2006 ජූලි 14 දිනැති අංක පීඊඩී 38 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | එකතු කළ අගය මත බද්ද සඳහා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී නොතිබුණු අතර උපයනවිට ගෙවීම්බද්දට යටත් නිලධාරීන්ගෙන් බදු අයකර ප්‍රේෂණය කර නොතිබුණි. |
| 2006 ඔක්තෝබර් 09 දිනැති අංක පීඊඩී 39 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අරමුදලේ උපදේශකවරයෙකුට රු.60,000 ක මාසික කුලී පදනම මත වාහනයක් අනුයුක්ත කිරීමට කටයුතු කර තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය.

2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.79,682,692 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 13,584,552 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.66,098,140 ක වැඩිවීමක් නිරීක්ෂණය විය.මූල්‍ය ප්‍රතිඵලය වැඩිවීමට පහත සඳහන් හේතු ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

| ආදායම් /වියදම් විෂයය. | වාසිදායක/(අවාසිදායක) බලපෑම. |
|---|---|
| | රු. |
| ඇප බැඳුම්කර ආදායම වැඩිවීම | 31,044,097 |
| භාණ්ඩාගාර බිල්පත් ආදායම වැඩිවීම | 19,638,499 |
| ස්ථාවර තැන්පතු ආදායම වැඩිවීම | 1,039,561 |
| ණය පොලී ආදායම වැඩිවීම | 202,158 |
| ණය පොලී ආදායම් කපාහැරීම අඩුවීම | 55,442,214 |
| අඩමාන ණය අධි වෙන්කිරීම අඩුවීම | (30,300,000) |
| විවිධ ආදායම් අඩුවීම | (424,065) |
| වැටුප් සහ වේතන වැඩිවීම | (3,417,432) |
| වෙනත් වියදම් වැඩිවීම | (7,126,892) |
| | 66,098,140 |

## 3. මෙහෙයුම් සමාලෝචනය.

### 3.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම මූල්‍ය පාලකගේ සාමාන්‍ය රාජකාරියක් වුවද , සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම වෙනුවෙන් රු.150,000 ක්වූ අතිරේක ගාස්තුවක් අරමුදලේ හිටපු මූල්‍ය පාලක වෙත ගෙවා තිබුණි.

(ආ) 2013 හා 2014 වර්ෂ සඳහා වූ කාර්යාල කුලී, එකතු කළ අගය මතබදු සහ විදුලි ගාස්තු වෙනුවෙන් රු.7,760,000 ක් ඉදිකිරීම්, පුහුණු සහ සංවර්ධන ආයතනය වෙත විධිමත් කුලී ගිවිසුමකින් තොරවසමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. තවද වර්ග අඩි 500 කඅතිරේකකාර්යාලබිම්ප්‍රමාණයක්සපයනුලැබීමටයටත්වප්‍රධාන කාර්යාලයේ වාර්ෂික කුලිය රු.120,000 සිට රු.200,000 දක්වා වැඩි කර තිබුණු නමුත් අතිරේක බිම් ප්‍රමාණය 2013 අප්‍රේල් මාසය අවසන් වන විටත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විධිමත්ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටියකින් තොරව තෝරාගෙන තිබුණු බාහිර පුද්ගලයකු වෙත, 2012-2016 කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම වෙනුවෙන් රු.300,000ක් ගෙවා තිබුණි. මෙම සංයුක්ත සැලැස්ම නිසිපරිදි සමාලෝචනය කර ක්‍රියාත්මක කිරීමට හෝ කාර්ය සාධනය ඇගයීමට හෝ කටයුතු කර තිබුණු බව තහවුරු නොවීය.

(ඈ) 2011 වර්ෂයේමූල්‍ය ප්‍රකාශනයන්ට අදාලව RAM Credit Rating නිර්නායකයක් ලබා ගැනීම පිණිස සමාලෝචිත වර්ෂය තුළදී පුද්ගලික සමාගමකට රු.457,143 ක් ගෙවා තිබුණි. නමුත් එම නිර්නායකය ඇතුළත් අවසන් වාර්තාව ලබා ගෙන

ප්‍රකාශයට පත් කිරීමට මෙම වාර්තාවේ දිනය දක්වාම කටයුතු කර නොතිබුණි. තවද එම වියදමේ ඵලදායිතාවය තහවුරු කර නොතිබුණි.

(ඉ) 2012 නොවැම්බර් 07 දින පවත්වා තිබුණු වැඩ මුළුවක් වෙනුවෙන් පෞද්ගලික සංචාරක හෝටලයකට රු.225,000 ක් ගෙවා තිබුණි. තවද එම වැඩමුළුවේ ප්‍රවාහන හා අනියම් වියදම් වෙනුවෙන් රු.75,000 ක් වූ අත්තිකාරමක් කාර්යය මණ්ඩල සාමාජිකයකු වෙත නිකුත් කර තිබුණි. සංචාරක හෝටලයට ගෙවන ලද ගාස්තු සඳහා නිල ලදුපතක් ලබා ගෙන නොතිබුණු අතර ප්‍රවාහන හා අනියම් වියදම් වෙනුවෙන් වැයකළ සත්‍ය වියදම සඳහා බිල්පත් ඉදිරිපත් කර නොතිබුණි. සම්පූර්ණ මුදල රු.300,000 ක් වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණු නමුත් වැඩමුළුව සඳහා වැය වූ සත්‍ය මුදල, සහභාගී වූ සංඛ්‍යාව, වැඩමුළුවේ ඵලදායිත්වය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි..

(ඊ) විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටියකින් තොරව ,මාසික කුළී ගෙවීමේ පදනම මත ලබාගෙන තිබුණු මෝටර් රථයක් වෙනුවෙන් 2012 වර්ෂය තුළදී ගෙවා තිබුණු මුළුකුළිය රු.601,500 ක් විය. තවද වාහන භාවිතය සම්බන්ධයෙන් මීටර් අංක සහිතව ධාවනය කරන ලද දුර ප්‍රමාණයන් සහ ඉන්ධන භාවිතය දක්වා මාසික ධාවන සටහන් විස්තර සකස් කර නොතිබුණි. ඒ අනුව වාහන භාවිතයේ ඵලදායිතාවය තහවුරුවී නොතිබුණි.

## 3.2 <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

සමාලෝචිතවර්ෂයේකාර්යමණ්ඩලපිරිවැයපහතින් සඳහන් වේ.

| | කොන්ත්‍රාත් | බාහිර සේවා | එකතුව |
|---|---|---|---|
| සේවක සංඛ්‍යාව | 3 | 19 | 22 |
| මූලික වැටුප රු. | 2,972,920 | 7,689,679 | 10,662,599 |
| අර්ථ සාධක අරමුදල් රු. | 407,327 | 740,775 | 1,148,102 |
| ජීවන වියදම් දීමනා රු. | 240,000 | - | 240,000 |
| දිරි දීමනා රු. | 228,500 | 501,150 | 729,650 |
| මුළු පිරිවැය රු. | 3,848,747 | 8,931,604 | 12,780,351 |
| ඒක පුද්ගල පිරිවැය රු. | 1,282,916 | 470,084 | 580,925 |

මෙම කාර්ය මණ්ඩල පිරිවැය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 ජූලි 08 දිනැති අංක පීඑඩ්පීයූදරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව හා2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූලව සියළුම රාජ්‍ය ව්‍යාපාර විසින් සිය සංවිධාන ව්‍යුහය ප්‍රතිව්‍යුහගතකරණය කළ යුතු වන අතර බඳවාගැනීම් / උසස්කිරීමේ පරිපාටි, සේවක සංඛ්‍යාව සහ වැටුප් පරිමාණසංශෝධනය කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යාකොමිෂන් සභාවේ නිර්දේශ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.

කාර්ය මණ්ඩලය පිළිබඳ චක්‍රලේඛ බලපැවැත්වීම අනවශ්‍ය බව නීතිපති උපදෙස් ලබාදී ඇති බවත්, භාරකාර ඔප්පුවේ විෂය අංක 4 යටතේ භාරකාර මණ්ඩලය තම අභිමතය පරිදි කටයුතු කර ඇති බවත් සභාපතිවරයා දැනුම් දී ඇත.

(ආ) කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු කාර්ය මණ්ඩලයේ සේවා කාලය දීර්ඝ කිරීම විධිමත් පිළිවෙතකට අනුව සිදු කර නොතිබුණි.

(ඇ) බාහිරසේවාපදනමමතබඳවාගෙනතිබුණුකාර්යමණ්ඩලයසඳහා කාර්ය සාධනය ඇගයීමකින් තොරව වැටුප් ගෙවා තිබුණි.

4. <u>පද්ධති හා පාලනයේ අඩුපාඩු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇපබැඳුම්කරඉල්ලුම්පත් ලේඛනගත කර නොතිබුණු අතර ප්‍රතික්ෂේප වූ ඉල්ලුම් පත් එසේ ප්‍රතික්ෂේප වීමට හේතුව සඳහන් කර ගොණු ගත කර නොතිබුණි. එබැවින් ප්‍රතික්ෂේපකරන ලද ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුව කුමක්ද යන්න නිසි අභ්‍යන්තර පාලන පිළිවෙතක් අනුව ඇගයීමට ලක්කර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් අසාර්ථකවීම මත මුදල් ගෙවන මෙන් සේවා යෝජකයින් විසින් ඉල්ලුම් කරනු ලබන ඇපබැඳුම්කර, නිකුත් කරන ලද සහ අධීක්ෂණය කරන ලද නිලධාරීන් විසින් විනිවිදභාවයෙන් යුක්තව නිසි වගකීමෙන් කටයුතු කලේද යන්න විමර්ෂණය කිරීමට හෝ තාක්ෂණික විගණනයක් කිරීමට හෝ හැකිවන පරිදිඅභ්‍යන්තර පාලන පිළිවෙතක් අනුගමනය කර නොතිබුණි.

කොන්ත්‍රාත් අසාර්ථක වීමේ ප්‍රවනතාවය අන්තර් ජාතික පිළිගැනීම් අවමය වූසියයට 0.8 සිට සියයට 1 ක් දක්වාවූප්‍රතිශතයක් වුවද ,මෙතෙක් ආයතනය මඟින් ඇපකර ලබා දීමේදී කොන්ත්‍රාත් අසාර්ථකවීම් සියයට 0.14 කට පමණ සීමාවී ඇති බව සභාපතිවරයා දැනුම් දී ඇත.

(ඇ) පහත දැක්වෙන කරුණු හේතුවෙන් සුළු මුදල් අග්‍රිම පාලනය විධිමත්වී නොතිබුණි.

(i) සමාලෝචිත වර්ෂයට අදාලව සුළු මුදල් අග්‍රිම ලේඛනයක් පවත්වා ගැනීමට හෝ ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී තබා ගෙන තිබුණු රු.60,000 ක සුළු මුදල් අග්‍රිමයෙන් රු.25,000 කට වැඩි ශේෂයක් අඛණ්ඩව අතරැදි මුදලක් ලෙස තබාගෙන තිබුණි .

(iii) අත්තිකාරම් පියවීමේ අසාමාන්‍ය ප්‍රමාදයන් පැවති නමුත් ඒ සම්බන්ධයෙන් අධීක්ෂණයක් සිදු කර නොතිබුණි.